# <u>උපදෙස් හා කොන්දේසි</u>

1. අයදුම්කරු සංචාරක බංගලාවේ නවාතැන් ගැනීමේදී මධ්‍යම සංසකෘතික අරමුදල මඟින් අනුමත කරන ලද අයදුම්පත හා මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල්පිටපත නිකේතන භාරකරු වෙත අනිවර්යෙන්ම ඉදිරිපත් කළ යුතුයි.
2. මධ්‍යම සංස්කෘතික අරමුදලේ හෝ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ නිලධාරියෙකු රාජකාරි නොවන, පෞද්ගලික මට්ටමින් නවාතැන් ගන්නා අවස්ථාවක තම රාජකාරී හැඳුන්ම්පත හෝ ජාතික හැඳුන්ම්පත ද, භාහිර පුද්ගලයින් තම ජාතික හැඳුන්ම්පත ද ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
3. එක් කාමරයක නවාතැන් ගත හැක්කේ දෙදෙනෙකුට පමණි.
4. නොවැළැක්විය අත්‍යවශ්‍ය හේතූන් මත මෙම වෙන් කිරීම අවලංගු කිරීමට සිදු විය හැක.
5. නිවාඩු නිකේතනය තුල හා පරිශ්‍රය තුල ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලට ඇති භාණ්ඩ හා උපකරණ වලට හානියක් නොවන පරිදි පරිහරණය කිරීම නවාතැන් ගන්නා පුද්ගලයන්ගේ යුතුකම හා වගකීම වන්නේය.
6. නිකේතනය තුල අනවශ්‍ය ශබ්ද ඇති නොකිරීම හා නවාතැන්ගෙන සිටින අනෙක් අමුත්තන්ගේ නිදහසට බාධාවක් නොවන පරිදි හැසිරීම සියළුම නවාතැන්කරුවන්ගේ බලාපොරොත්තුව වේ.